# නවෝත්පාදක අයදුම් පත්‍රය

සම්පූර්ණ කිරීමට පෙර මෙම අයදුම් පත්‍රයේ අන්තර්ගත මඟපෙන්වීම් හා සාමාන්‍ය උපදෙස් ප්‍රවේශමෙන් කියවන්න.

**<u>සටහන</u>:**

- අයදුම්පත්‍රය භාරදීමට ප්‍රථම පහත සඳහන් තොරතුරු පත්‍රිකාව කියවන්න.
- මෙම අයදුම්පත්‍රයේ සමන්විත තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා කරන බව ශ්‍රී ලංකා මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය තහවුරු කරන අතර අයදුම් කර ඇති නව නිපැයුම නිශ්චය කිරීම සඳහා හැර වෙනත් කිසිදු කාර්යයක් සඳහා භාවිතා නොකරනු ඇත.
- මුල් නිර්මාණයක් නම් පමණක් ඉදිරිපත් කළ යුතුය. සොරකම් කරන ලද අදහස් සඳහා ඉඩ ලබා නොදෙනු ඇති අතර, ස්වයංක්‍රීය අයෝග්‍යතාවයට මඟ පෙන්වනු ඇත.
- බහුවිධ අයදුම් කිරීම් සඳහා ඉල්ලුම් පත්‍ර වෙන වෙනම භාවිතා කරන්න.
- ආයතනික අනුබද්ධවීම සහ කණ්ඩායම් ව්‍යාපෘති ඇගයීම සිදු නොකරනු ඇත.
- මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ තීරණය අවසන් තීරණය වනු ඇති අතර, අයදුම්කරු විසින් කිසිදු ආකාරයකින් බලපෑම් කිරීම හෝ එසේ කිරීමට උත්සහ කිරීම ආදිය ස්වයංක්‍රීය අයෝග්‍යතාවයට මඟ පාදනු ඇත.
- සම්පූර්ණ කර අත්සන් කරන ලද අයදුම් පත්‍රයේ ස්කෑන් කරන ලද පිටපත් i2i@mo.treasury.gov.lk යන ලිපිනයට විද්‍යුත් තැපෑල මගින් එවිය යුතුවේ.

**<u>පළමු කොටස: නව නිපැයුම්කරුගේ විස්තර</u>**

වාසගම: …………………………………………………………

වෙනත් නම් ………………………………………………….....ස්ත්‍රී පුරුෂභාවය: ……………………..

ජාතිය…………………………………..

හැඳුනුම්පත් අංකය:……………………………………………(කරුණාකර ජාතික හැඳුනුම්පතේ පිටපතක් අමුණන්න.)

ලබා ඇති ඉහළම අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම්. අදාළ වන්නේනම්, කරුණාකර සහතිකපත්වල පිටපතක් අමුණන්න.

………………………………………………………………………………………………….

නව නිපැයුම් සම්බන්ධයෙන් පෙර ලබා ඇති තිළිණ සහ එම තිළිණ පිරිනමන ලද ආයතනය (කරුණාකර සහතික පතෙහි/ සහතිකපත්වල පිටපතක්/ පිටපත් අමුණන්න.)

…………………………………………………………………………………………………..

**වත්මන් සම්බන්ධ කර ගතහැකි තොරතුරු:**

විද්‍යුත් ලිපිනය: ..........................................................ජංගම දුරකථන අංකය……………………………

තැපැල් ලිපිනය
………………………………………………………………………………………………

වර්තමාන රැකියාව ……………………………………………………………………………..

## දෙවන කොටස: යෝජිත නව නිපැයුම/ තාක්ෂණය පිළිබඳ විස්තරය

පහත කොටු තුළ දක්වා ඇති උපදෙස් අනුව ඔබගේ නව නිපැයුම විස්තර කරන්න.

| |
|---|
| **2.1.** නවෝත්පාදනයේ නම **:** |
| **2.2.** නවෝත්පාදනය පේටන්ට් බලපත්‍රය ලබා තිබේද**?**<br><br>ඔව් නම්, සහතිකපත් අංකය දක්වන්න............................................................................... |
| **2.3.** අයදුම් කරන ක්ෂේත්‍රය**:**<br>අ) ආහාර හා කෘෂිකර්මාන්තය<br>ආ) බල ශක්තිය<br>ඇ) සෞඛ්‍යය<br>ඈ) ජලය, අපද්‍රව්‍ය හා පරිසරය<br>ඉ) තොරතුරු තාක්ෂණය, ඉලෙක්ට්‍රොනික විද්‍යාව සහ මූල්‍ය තාක්ෂණය |
| **2.4.** නව නිපැයුම සම්බන්ධයෙන් කෙටි විස්තරයක් සඳහන් කරන්න. (උපරිම වචන 300) |

| |
|---|
| |
| **2.5.** අදාළ ක්ෂේත්‍රය තුළ, නව නිපැයුම මගින් විසඳීමට අපේක්ෂිත ගැටලුව විස්තර කරන්න**.** (උපරිම වචන 50) |

**3 වන කොටස**: **නව නිපැයුම නිශ්චය කිරීමේ නිර්ණායක**

පහත නිර්ණායක මත පදනම්ව, ඔබගේ නව නිපැයුම පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න.

| |
|---|
| **3.1.*නවතාව***: වෙළඳපොළෙහි ඇති සමාන හෝ විකල්ප නිෂ්පාදන සමඟ සැසඳීමේදී මෙම නව නිපැයුමෙහි ඇති අනන්‍යතාවය සහ සුවිශේෂී බව. **(**උපරිම වචන 100**):** |
| **3.2.*අලෙවි කළ හැකි බව :*** ඉලක්ක වෙළඳපොළට ළඟාවීමට අපේක්ෂා කරන ගැටලුව විසඳීම සඳහා යම් මිලකට මෙම නව නිපැයුම් කෙතරම් දුරට යොදාගත හැකි ද යන්න **(**උපරිම වචන 100**):** |
| **3.3.*සම්පත් ප්‍රශස්ත අයුරින් භාවිතා කිරීම:*** මෙම නවෝත්පාදනය "ව්‍යාපාරවල කාර්යක්ෂමතාවය" ඉහළ නැංවීමට කොපමණ දුරකට උපකාරි වේදැයි පැහැදිලි කරන්න. **(**උපරිම වචන 200**):** |

**3.4. *විපසරිය*:** මෙම විසඳුම වඩාත් ආසන්න හෝ දේශීය වෙළඳපොළට යොදාගැනීමෙන් ඔබ්බට මේ හා සමාන වෙනත් වෙළඳපොළවලදී කොපමණ දුරකට ඉතා පහසුවෙන් භාවිතා කළ හැකි ද යන්න. **(**උපරිම වචන 2***00)*:**

***3.5.සමාජ බලපෑම***: මෙම නවෝත්පාදනය මගින් ඉලක්ක ප්‍රජාවට හා ඉන් ඔබ්බට ධනාත්මක බලපෑම් හෝ අපේක්ෂිත වෙනස්කම් ඇතිකිරීමේ හැකියාව **(**උපරිම වචන 200***)*:**

3.6. **භාවිතා කිරීමේ පහසුව:** මෙම නවෝත්පාදන සංකල්පය කොපමණ දුරකට, වෙනත් පුද්ගලයෙකුට පහසුවෙන් අවබෝධ කරගත හැකි ද යන්න. (උපරිම වචන 200):

## 4 වන කොටස: අත්සන්

### 4.1. නව නිපැයුම්කරු

මා දන්නා තරමින් ඉහත විස්තර කර ඇති නව නිපැයුම මාගේම නිර්මාණයක් වන අතර, වෙනත් කිසිවෙකු විසින් මීට ඉහතදී සිදු කරන ලද්දක් නොවන බව ප්‍රකාශ කරමි.

i). නම: …………………………………………………. අත්සන …………………..

ii). දිනය: ...................................

## නවෝත්පාදකයින් සඳහා තොරතුරු පත්‍රිකාව

1. I2I **යනු කුමක් ද**?

   I2I යනු 2018 අයවැය යෝජනාවකි. මෙහි අරමුණ වන්නේ නවෝත්පාදකයින්ට ඔහුගේ/ ඇයගේ නව අදහස් වාණිජකරණය කිරීමට සහ එම වාණිජකරණයෙන් අදාළ සමාගමට ප්‍රතිලාභ ලබාගැනීමට හැකි වන පරිදි, නවෝත්පාදකයින් සුදුසු කර්මාන්තවලට ප්‍රවේශ කිරීමයි.

2. **සහභාගි විමට සුදුසුකම් ලබන්නේ කවුරුන් ද**?
   - 2018 ජූලි 01 දිනට වයස අවුරුදු 18 - 40 අතර ශ්‍රී ලංකා පුරවැසියන්

     **සහ**
   - පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් තිබිය යුතුය. (සටහන : පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිය සම්පූර්ණ කර ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින අයට ද අයදුම් කළ හැක. නමුත්, විශ්ව විද්‍යාලයෙන් ලබා ගත් සහතික කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.)

     **හෝ**
   - ජාතික හෝ අන්තර්ජාතික මට්ටමේ නව නිපැයුම් තරඟවලින් ජයග්‍රහණය ලැබූවන්

   - නව නිපැයුම හෝ අදහස පහත සඳහන් ක්ෂේත්‍රයක විය යුතුය:
     - ආහාර හා කෘෂිකර්මාන්තය
     - බල ශක්තිය
     - සෞඛ්‍යය
     - ජලය, අපද්‍රව්‍ය හා පරිසරය
     - තොරතුරු තාක්ෂණය, ඉලෙක්ට්‍රොනික විද්‍යාව සහ මූල්‍ය තාක්ෂණය

3. **නවෝත්පාදකයින්ට මේ සඳහා සහභාගි විය හැක්කේ කෙසේද**?

   නවෝත්පාදකයින් විසින් සම්පූර්ණ කර, අත්සන් කරන ලද www.treasury.gov.lk තුළින් භාගත කළ හැකි අයදුම් පත්‍රයේ ස්කෑන් කරන ලද පිටපත් 2018 අගෝස්තු මස 20 දින මධ්‍යම රාත්‍රී පැය 00.00 ට පෙර i2i@mo.treasury.gov.lk යන විද්‍යුත් තැපැල මගින් එවිය යුතුය.

   අයදුම්පත්‍ර සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂාවලින් කුමන හෝ භාෂාවකින් සම්පූර්ණ කළ හැක.

   කෙටි ලැයිස්තුගත කරන ලද අයදුම්කරුවන්ගේ අයදුම් පත්‍රවල දෘඩ පිටපත (hard copy), සුදුසුකම් සනාථ කිරීමේ ලියවිලි සමඟ ඉදිරිපත් කළ යුතුය.

4. **නවෝත්පාදකයින් තෝරාගැනීම සිදු කරන්නේ කෙසේද**?

   අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද විශේෂඥයින්ගෙන් සහ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත මෙහෙයුම් කමිටුව සහ තාක්ෂණික ඇගැයීම්

කමිටුවක් මගින් අයදුම් පත්‍රවල සඳහන් තොරතුරු මත සහ අවශ්‍ය වන්නේ නම්, පසුව පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණ මගින් නවෝත්පාදකයින් තෝරාගනු ලබයි.

5. **නවෝත්පාදකයින්ට දැනුම් දීම සිදු කරන්නේ කෙසේද**?
   සුදුසුකම් ලබන නවොත්පාදකයින්ට පමණක් විද්‍යුත් තැපැල මගින් සහ තැපැල්/ කුරියර් මගින් දැනුම් දීම සිදු කරනු ලබයි.

6. **තෝරා නොගත් අයදුම්කරුවන්ට අභියාචනා කළ හැකි ද**?
   නොහැක. මෙහෙයුම් කමිටුව සහ තාක්ෂණික ඇගැයීම් කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.

7. I2I **වැඩසටහන සඳහා සහභාගී වීමෙන් ලැබෙන වාසි මොනවා ද**?
   - මූල්‍යමය සහ තාක්ෂණික සහයෝගය නොමැතිකමින් බොහෝ විට නව අදහස් වාණිජකරණය කිරීමට නව නිපැයුම්කරුවන්ට හැකියාවක් නොමැත. කෙසේ වුවද, සමාගමක් මගින් නව නිපැයුම්කරුවන් සේවයේ යෙදවූ විට, අදාළ නිෂ්පාදනය ගවේෂණය සහ සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පරිසරය අදාළ සමාගම විසින් සපයා දෙනු ලබයි. ඵලදායී නව නිපැයුම, නවෝත්පාදකගේ සහ සමාගමේ අභිමතය පරිදි හවුල්කාර සමාගම සමගින් ප්‍රයෝජනයට ගත හැක.
   - නවෝත්පාදක සහ සමාගම යන දෙපාර්ශවය අතර ඇති කරගත් එකඟතාවය අනුව, ඵලදායී නව නිපැයුම සඳහා ස්වාධිකාරය අවශ්‍ය වන්නේ නම්, පේටන්ට් බලපත්‍රය ලබාගැනීම සඳහා වැය වන මුදල සඳහා අවශ්‍ය මූල්‍යමය සහයෝගය රජය විසින් සපයා දෙනු ලබයි.
   - කර්මාන්ත විශේෂඥයින් විසින් වැඩසටහන පුරාවට නවොත්පාදකයින් සඳහා අවශ්‍ය උපදේශනය ලබා දෙනු ඇත.

වැඩිදුර තොරතුරු අවශ්‍ය වන්නේ නම්, ඔබේ ගැටළුව i2i@mo.treasury.gov.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ දුරකථන අංක 011-2484842 හෝ 011-2151493 ට යොමු කරන්න.

## කර්මාන්ත සඳහා තොරතුරු පත්‍රිකාව

1. **I2I යනු කුමක්ද**?
   I2I යනු 2018 අයවැය යෝජනාවකි. මෙහි අරමුණ වන්නේ නවොත්පාදකයින්ට ඔහුගේ/ ඇයගේ නව අදහස් වාණිජකරණය කිරීමට සහ එම

වාණිජකරණයෙන් අදාළ සමාගමට ප්‍රතිලාභ ලබාගැනීමට හැකි වන පරිදි, නවොත්පාදකයින් සුදුසු කර්මාන්තවලට ප්‍රවේශ කිරීමයි.

2. **කර්මාන්තවලට මේ සඳහා සහභාගී විය හැක්කේ කෙසේද**?
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් පහත සඳහන් ක්ෂේත්‍රයක නියුක්ත හෝ එම ක්ෂේත්‍රවලට විවිධාංගීකරණය වීමට කැමැත්තක් දක්වන කර්මාන්තවලින් යෝජනා කැඳවනු ලබයි;
   - ආහාර හා කෘෂිකර්මාන්තය
   - බල ශක්තිය
   - සෞඛ්‍යය
   - ජලය, අපද්‍රව්‍ය හා පරිසරය සහ
   - තොරතුරු තාක්ෂණය, ඉලෙක්ට්‍රොනික විද්‍යාව සහ මූල්‍ය තාක්ෂණය

මේ සඳහා ඔබේ කැමැත්ත පිළිබඳ ප්‍රකාශය 2018 අගෝස්තු මස 20 දින මධ්‍යම රාත්‍රී පැය 00.00 ට පෙර i2i@mo.treasury.gov.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට එවිය යුතුය

3. **යම් කිසි සමාගමකට මේ සඳහා අයදුම් කළ හැකි ද**?
හැකිය, ශ්‍රී ලංකාව තුළ සංස්ථාගත කරන ලද, නව තාක්ෂණය හෝ ක්‍රියා පිළිවෙළක් භාවිතා කරමින් තම නිෂ්පාදනය හෝ සේවාව සංවර්ධනය කිරීමට කැමැත්ත දක්වන සමාගමකට මේ සඳහා අයදුම් කළ හැක. නවෝත්පදකට වැඩ කිරීම සඳහා අවශ්‍ය පරිසරයක් සපයාදීම සඳහා හැකියාව සමාගම සතු විය යුතුය. එම සමාගම්, පහත සඳහන් ක්ෂේත්‍රයක දැනටමත් නියුක්ත හෝ නියුක්ත වීමට අදහස් කරන සමාගමක් විය යුතුය:
   - ආහාර හා කෘෂිකර්මාන්තය
   - බල ශක්තිය
   - සෞඛ්‍යය
   - ජලය, අපද්‍රව්‍ය හා පරිසරය
   - තොරතුරු තාක්ෂණය, ඉලෙක්ට්‍රොනික විද්‍යාව සහ මූල්‍ය තාක්ෂණය

මාස 24 ක් සඳහා බල පැවැත්වෙන පරිදි, නවෝත්පාදකයා සේවයේ යොදවන්නේ කුමන ස්ථානයේද යන්න පිළිබඳව රජය සහ නවෝත්පාදකයා සමඟ අදාළ සමාගම ත්‍රෛපාර්ශ්වීය ගිවිසුමකට එළඹිය යුතුය. එළදායී නව නිපැයුම, නවෝත්පාදකගේ සහ සමාගමේ අභිමතය පරිදි නවෝත්පාදකයා සමඟ එක්ව ප්‍රයෝජනයට ගත හැක

4. **රජය, අදාළ සමාගම සඳහා සහයෝගය ලබාදෙන්නේ කෙසේද** ?

මාස 24 ක කාලයක් සඳහා නවෝත්පාදකගේ දළ මාසික වැටුපෙන් 50% ක් උපරිමය රුපියල් 50,000.00 ක් දක්වා ප්‍රතිපූරණය කිරීමට රජය සහයෝගය ලබා දේ. ශ්‍රී ලංකාව තුළ අදාළ නිෂ්පාදනයේ ස්වාධිකාරිය ලබාගැනීමට සහ අනෙකුත් අනුයාත වියදම් රජය විසින් දරනු ඇත.

5. **මෙය සමාගම සඳහා වාසිදායක වන්නේ කෙසේද**?

   සමාගම්වල සිය ඵලදායීතාවය වැඩිදියුණු කරගැනීමට, සිය නිෂ්පාදන ව්‍යාප්ත කිරීමට සහ පාරිභෝගිකයා මූලික කර ගනිමින්, මෙම නවෝත්පාදකයා, නව අදහස් සමාගම තුළට රැගෙන එනු ඇත.

වැඩිදුර තොරතුරු අවශ්‍ය වන්නේ නම්, ඔබේ ගැටළුව i2i@mo.treasury.gov.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට හෝ දුරකථන අංක 011-2484842 හෝ 011-2151493 ට යොමු කරන්න.